සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education, Southern Province

08 | S | II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்

**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**13 ශ්‍රේණිය** | **Grade 13**

**කෘෂි විද්‍යාව - I**
**Agricultural Science - I**

**පැය දෙකයි** | **Two hours**

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) පිළිතුරුවලින් ඉතාමත් ගැළපෙන පිළිතුර කතිර (x) ලකුණකින් යොදා දක්වන්න.**

(01) අර්තාපල්, උක්, ගම්මිරිස්, කුරුඳු යන බෝග සඳහා වූ පර්යේෂණ ආයතන ස්ථාපිත කර ඇති ප්‍රදේශ පිළිවෙලින්,

1. මාතලේ, තිහගොඩ, ලබුදුව, ගන්නෝරුව
2. බණ්ඩාරවෙල, උඩවලව, රත්නපුර, කඹුරුපිටිය
3. උඩවලව, තිහගොඩ, මාතලේ, සීතාඑළිය
4. සීතාඑළිය, උඩවලව, මාතලේ, කඹුරුපිටිය
5. ගන්නෝරුව, උඩවලව, රත්නපුර, කඹුරුපිටිය

(02) උෂ්ණත්වය බෝග වගාවට බලපාන ආකාරය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ශාකවල කැරොටිනොයිඩ් වර්ණක සංස්ලේෂණයට රාත්‍රී උෂ්ණත්වය වැඩි විය යුතුය.
B - $C_3$ ශාකවල ප්‍රභාසංස්ලේෂණය සඳහා ප්‍රශස්ත උෂ්ණත්වය $15^0C$ - $25^0C$ අතර වේ.
C - සමහර බීජවල සුප්තතාවය කෘත්‍රිමව නැතිකර බීජ ප්‍රරෝහණය උත්තේජනය කිරීමට උෂ්ණත්වය උපයෝගී කරගත හැක.
D - අර්තාපල්වල වැඩි ආකන්ද වර්ධනයක් සඳහා දිවා රාත්‍රී උෂ්ණත්ව වෙනස $8^0C$ ට වඩා අඩු විය යුතුය.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වනුයේ,

1. A හා B පමණයි
2. B හා C පමණයි
3. C හා D පමණයි
4. A, B හා C පමණයි
5. A, B හා D පමණයි

(03) පහතරට එළවළු වගාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවන භූමියක පසෙහි අඩංගු සංඝටක පහත වගුවේ දැක්වේ.

| පාංශු ඛනිජ | කාබනික ද්‍රව්‍ය සහ ජීවීන් | පාංශු ජලය | පාංශු වාතය |
|---|---|---|---|
| 65% | 13% | 15% | 17% |

ඉහත පසෙහි සාර්ථකව එළවලු වගා කිරීමට සුදුසු තත්වයට පත් කිරීමට කළ යුත්තේ,

1. පසට හොඳින් ජල සම්පාදනය කර රසායනික පොහොර යෙදීම ය.
2. පස හොඳින් ජලවහනය කර කාබනික පොහොර යෙදීම ය.
3. ශුන්‍ය බිම් සැකසීම සිදු කිරීම ය.
4. කාබනික ද්‍රව්‍ය යොදා පස හොඳින් පෙරළීම ය.
5. පස හොඳින් ජලවහනය කර අවම බිම් සැකසීම සිදු කිරීම ය.

(04) වාරි ජලය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශයන්හි බෝග වගා කිරීමේ දී මහ කන්නයට වඩා යල කන්නයේ දී අස්වනු වැඩිවීමක් පෙන්නුම් කිරීමට වඩාත් සමීප හේතුව වන්නේ,

1. ජල හිඟතාවයක් නොමැති වීම ය.
2. යල කන්නයේ දී රෝග හා පලිබෝධ අඩුවීම ය.
3. යල කන්නයේ දී සූර්යාලෝක තීව්‍රතාවය වැඩිවීම ය.
4. වාරි ජලය යටතේ අපහසුතාවයකින් තොරව පොහොර යෙදීමට හැකිවීම ය.
5. වියළි තත්ව යටතේ යල කන්නයේ දී වඩාත් හොඳ බීජ භාවිතා කළ හැකි වීම ය.

(05) ජායාංගි පුෂ්ප, පුමාංගි පුෂ්ප හා ද්විලිංගික පුෂ්ප යන පුෂ්ප වර්ග තුනම දක්නට ඇති බෝග වර්ගය,

1. පැපොල් 2. අලිපේර 3. අඹ 4. අන්නාසි 5. වී

(06) ශාක හෝමෝනවල ක්‍රියාකාරීත්වය පිළිබඳ නිවැරදි වගන්තිය වන්නේ,

1. සයිටොකයනින් පත්‍ර පතනය උත්තේජනය කරයි.
2. ගිබරලින් ශාක කුරු වීම උත්තේජනය කරයි.
3. ඇබ්සිසික් අම්ලය බීජ ප්‍රරෝහණය උත්තේජනය කරයි.
4. ඔක්සින් පාර්ශ්වික අංකුර වර්ධනය උත්තේජනය කරයි.
5. එතිලින් අන්නාසිවල මල්හට ගැනීම උත්තේජනය කරයි.

(07) ආරක්ෂිත ගෘහ පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

1. ලැත් නිවාස තුළ කෘමි පලිබෝධ පාලනය හොඳින් සිදුවේ.
2. දැල් ගෘහවල මූලික අරමුණ ආර්ද්‍රතාව හා උෂ්ණත්වය පාලනය කිරීමයි.
3. පොලිතින් ගෘහවල ආවරණයේ ඇල්ගී වර්ධනය වීම නිසා වසරකට වරක්වත් ආවරණය අලුත් කළ යුතුය.
4. පොලිතින් ගෘහවල කෘමි ආරක්ෂිත දැල් භාවිතා කිරීමෙන් එහි උෂ්ණත්වය අනවශ්‍ය ලෙස ඉහළ යාම පාලනය කළ හැක.
5. ශ්‍රී ලංකාවේ කැපුම් මල් වගාව සඳහා හරිතාගාර බහුලව භාවිතා වේ.

(08) එළදෙනුන්ගේ කිරි අස්වැන්න කෙරෙහි විවිධ සාධක බලපාන අතර ඒ සඳහා වඩාත්ම බලපාන පරිසර සාධකය වන්නේ,

1. ආලෝක තීව්‍රතාවය හා දිවාකාලයේ දිගයි.
2. සාපේක්ෂ ආර්ද්‍රතාවයයි
3. වර්ෂාපතන ප්‍රමාණයයි.
4. පරිසර උෂ්ණත්වයයි.
5. සුළගේ වේගයයි.

(09) සම්භවය සහ කාර්යය අනුව කුකුළන් වර්ග කරයි. ඒ අනුව 'ලෙගෝන්' යනු,

1. බිත්තර සඳහා වඩාත් සුදුසු යුරෝපීය වර්ගයකි.
2. බිත්තර සඳහා වඩාත් සුදුසු මධ්‍යධරණී වර්ගයකි.
3. බිත්තර සඳහා වඩාත් සුදුසු ඇමරිකානු වර්ගයකි.
4. බිත්තර හා මස් සඳහා වඩාත් සුදුසු යුරෝපීය වර්ගයකි.
5. බිත්තර හා මස් සඳහා වඩාත් සුදුසු මධ්‍යධරණී වර්ගයකි.

(10) ශාක වර්ධනයට පසෙන් පමණක් ලබාගන්නා මහා පෝෂක අඩංගු පිළිතුර වනුයේ,

1. C, H, Ca, Mg, S
2. O, Cu, Zn, Ni, C
3. C, N, P, K, Mn
4. N, P, K, Ca, Mg
5. C, N, P, K, B

(11) ශ්‍රී ලංකාවේ පොල් රතු ගුල්ලා මර්දනය සඳහා පමණක් නිර්දේශ කර ඇති කාබනික පොස්පරස් (organo phosphates) කාණ්ඩයේ කෘමි නාශකය වන්නේ,

1. කාබොෆියුරාන්
2. මොනොක්‍රොටපොස්
3. ක්ලෝරොපයිරිපොස්
4. පර්මෙත්‍රින්
5. ඩයිමෙතෝඒට්

(12) ගොවිමහතෙක් මද බෑවුමක් සහිත භූමියක බෝග වගාවක් ඇරඹීම සඳහා මුලින් එම බිමට වල්නාශකයක් යොදා පැළ සිටුවන ස්ථානයේ මදක් පස බුරුල් කර බෝග සිටුවන ලදී. මෙහි දී සිදුකරන ලද බිම් සැකසීමේ ක්‍රමය වන්නේ,

1. සම්මත බිම් සැකසීම.
2. අවම බිම් සැකසීම.
3. ශුන්‍ය බිම් සැකසීම.
4. උපරිම බිම් සැකසීම.
5. වසර පුරා බිම් සැකසීම.

(13) වගාවන් රාශියකට හානිකරන සේනා දළඹුවා ලෙස හඳුන්වන කෘමි පළිබෝධකයා අයත්වන කෘමි ගෝත්‍රය වන්නේ,

1. Coleoptera
2. Diptera
3. Lepidoptera
4. Hemiptera
5. Orthoptera

(14) පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. කහ පැහැති පලතුරුවල විටමින් A පූර්වග වන බීටා කැරොටින් අඩංගු වේ.
2. බෙරි බෙරි බෝගයට හේතුව වූයේ විටමින් $B_2$ (රයිබොෆ්ලේවින්) ආහාරවල හිඟ වීමයි.
3. ෆෝලේට් රතු රුධිරානු නිෂ්පාදනයට වැදගත්වේ.
4. රුධිරය කැටිගැසීමේ ක්‍රියාවලිය සඳහා විටමින් K වැදගත් වේ.
5. රුටේසියේ කුලයේ පලතුරුවල විටමින් C බහුලව අඩංගු වේ.

(15) නිර්පාංශු වගා ක්‍රමයක් වන 'පාවෙන වගාව' සඳහා වඩාත් යෝග්‍ය බෝගයක් වන්නේ,

1. සලාද
2. බෙල්පෙපර්
3. තක්කාලි
4. කැරට්
5. ලීක්ස්

(16) පරිසර සාධක අනුව උත්ස්වේදන සීඝ්‍රතාවය වෙනස්වන අයුරු පෙන්වන ප්‍රස්ථාර පහත දැක්වේ.




The National e-learning Portal for The General Education

ඉහත ප්‍රස්ථාරවල A, B, C ලෙස දක්වා ඇති සාධක පිළිවෙලින්,

1. ආර්ද්‍රතාවය, උෂ්ණත්වය, ආලෝක තීව්‍රතාවය
2. ආලෝක තීව්‍රතාවය, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය
3. ආලෝක තීව්‍රතාවය, ආර්ද්‍රතාවය, උෂ්ණත්වය
4. ආර්ද්‍රතාවය, සුළඟේ වේගය, උෂ්ණත්වය
5. උෂ්ණත්වය, සුළඟේ වේගය, ආර්ද්‍රතාවය

(17) රෝමාන්තකයින්ගේ සංකීර්ණ ආමාශය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - සංකීර්ණ ආමාශයේ විශාලම කුටීරය රූමනය වන අතර කුඩාම කුටීරය විතංශිකාව වේ.
B - විතංශිකාව පෙරනයක් ලෙස ක්‍රියා කරයි.
C - රූමන තරලයේ ඇති ජලය හා පෝෂක අවශෝෂණය කිරීමේ හැකියාව බහු නැමිය සතුය.
D - ජඨරාශය හා බහුනැමිය අතර විතංශිකාව පිහිටයි.

මින් වඩාත් නිවැරදි වන්නේ,

1. A හා B පමණි
2. A හා D පමණි
3. A, B හා C පමණි
4. B, C හා D පමණි
5. A, C හා D පමණි

(18) කුකුළන්ට වැළඳෙන වෛරස් රෝග සඳහන් පිළිතුර වන්නේ,

1. කොක්සිඩියෝසිස් හා රනිකට්
2. පුල්ලෝරම් හා ගම්බෝරෝ
3. රනිකට් හා ගම්බෝරෝ
4. රින්ඩර්පෙස්ට් හා මරෙක්ස්
5. කුරුළු උණ හා පුල්ලෝරම්

(19) මිනිස් ශරීරය තුළ අඩංගු වන යකඩ ප්‍රමාණයෙන් හීමොග්ලොබින් තුළ අඩංගු යකඩ ප්‍රතිශතය වන්නේ,

1. 15%
2. 30%
3. 45%
4. 55%
5. 65%

(20) යෝගට් නිපදවීම සඳහා යොදා ගන්නා බැක්ටීරියා විශේෂයක් වන්නේ,

1. *Lactobacillus bulgaricus*
2. *Streptococus lactis*
3. *Streptococus cremoris*
4. *Streptococus diacetalactis*
5. *Clostridium botulinum*

(21) සත්ත්ව ගොවිපලක පිටලෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A ඒකාකාර සතුන් රැළක් පවත්වා ගැනීම සඳහා පිටලෑම අවශ්‍ය වන බැවින් එය නොකඩවා කළ යුතු කාර්යයකි.

B පිටලෑම මඟින් ගොවිපළ සම්පත් හා යෙදවුම් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට ඉඩ සැලසේ.

C ගොවිපල තුළ නිසි කළමණාකරණයක් සිදුවේ නම් පිටලෑම් ක්‍රියාවලියක අවශ්‍යතාවයක් පැන නොගනී.

ඉහත ප්‍රකාශවලින් වඩාත් නිවැරදි වන්නේ,

1. A පමණි
2. B පමණි
3. C පමණි
4. A හා B පමණි
5. B හා C පමණි

(22) පසු අස්වනු හානි නිසා ඇතිවන ගැටළුවක් **නොවන්නේ,**

1. අස්වනුවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව අඩුවීම
2. අස්වනු අපතේ යාම නිසා සම්පත් අපතේ යාම
3. ආහාර සුරක්ෂිතතාව අඩුවීම
4. පාරිභෝගික රුචිකත්වය ඉහළ යාම
5. ආර්ථික හා මානසික ගැටළු ඇති වීම

(23) ප්‍රවේනික විචලතාවයක් ඇති ශාක ගහනයකින් වරණය මඟින් වඩාත් උසස් ලක්ෂණ සහිත ජනිතයින් නිරූපණය කර ඇති ප්‍රස්ථාරය වන්නේ, (අඳුරු කර ඇත්තේ උසස් ලක්ෂණ සහිත ජනිතයින්ය.)

1.



2.



3.



4.



5.


(24) ස්වාභාවික වර්ධක ප්‍රචාරක ව්‍යුහයක් වන ස්කන්ධ ආකන්ධ සඳහා නිවැරදි උදාහරණ වන්නේ,

1. හිගුරල, අර්තාපල්
2. ගහල, ඉන්නල
3. බතල, බුත්සරණ
4. අර්තාපල්, බුත්සරණ
5. ඉන්නල, ඩේලියා

(25) ජාන ඉංජිනේරු විද්‍යාවේ දී බහුඅවයවික දාම ප්‍රතික්‍රියාව (PCR) යොදා ගැනේ. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ,

1. අවශ්‍ය ලක්ෂණ සහිත ජානය හඳුනා ගැනීම වේ.
2. ජානය කපා ඉවත් කිරීම වේ.
3. වෙන් කරගත් ජානය වාහකයාට බද්ධ කිරීම වේ.
4. කපාගත් ජානය ගුණනය කිරීම වේ.
5. රෝපණ මාධ්‍යයට වෛරස් ඇතුළු වීම වැළැක්වීම වේ.

(26) පසක අඩංගු සංඝටක කිහිපයක් පහත දැක්වේ.

පසේ ඝන ද්‍රව්‍ය පරිමාව - $200cm^3$

පසේ ජලයේ ස්කන්ධය - 150g

පාංශු වායු පරිමාව - $50cm^3$

ජලයේ ඝනත්වය - $1g\ cm^{-3}$

මෙම පසෙහි පාංශු සච්ඡිද්‍රතාවය ($P_E$) වනුයේ,

1. 25%
2. 50%
3. 60%
4. 75%
5. 80%

(27) 'සංයුක්ත පොහොර' යනු,

1. එක් පෝෂකයක් පමණක් ලබා දෙන පොහොරකි.
2. පෝෂක කිහිපයක් ලබාදෙන පොහොරකි.
3. N, P සහ K යන පෝෂක මිශ්‍රකර සකස් කරන පොහොරකි.
4. N, P හා K ට අමතරව වෙනත් ක්ෂුද්‍ර පෝෂකයක් ලබාදෙන පොහොරකි.
5. N, P හා K මිශ්‍රකර ඒ වටා ආවරණයක් යොදා සාදන පොහොරකි.

(28) මතුපිට ජලදේහ සුපෝෂණයට ලක්වන්නේ ප්‍රධාන වශයෙන්,

1. කෘමිනාශක වැඩිපුර යෙදීමෙනි.
2. වල්නාශක වැඩිපුර භාවිතයෙනි.
3. කාබනික පොහොර භාවිතයෙනි.
4. නයිට්‍රජන් පොහොර වැඩිපුර භාවිතයෙනි.
5. වර්ධක යාමක වැඩිපුර භාවිතයෙනි.

(29) බීජ සෞඛ්‍යය පරීක්ෂා කිරීමේ වැදගත්කමක් **නොවන්නේ,**

1. පාරිභෝගික තෘප්තිය වැඩි වීම
2. ජාත්‍යන්තර ව්‍යවස්ථාවන්ට පමණක් අනුකූල වීම
3. අන්තර් ජාතික බීජ සංසරණය සඳහා වැදගත් වීම
4. ජාත්‍යන්තර බීජ කර්මාන්තයට උපකාරී වීම
5. බීජ සමාගම්වල අවදානම කළමණාකරණයට සහාය වීම

(30) තවාන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ජල රෝපිත වගාව සඳහා ස්පොන්ජ් තවානක පැළ නිපදවා ගැනීම සිදුකරයි.

B - සුසංහිත තවාන් වැටකොලු, පතෝල, වැනි බීජ සඳහා වඩාත් සුදුසුවේ.

C - නෙරිඩෝකෝ තවානකින් ලබාගන්නා පැළ ක්ෂේත්‍රයේ සිටුවීමෙන් මුල්වලට සිදුවන හානිය අවම වේ.

D - වැලි තවාන භාවිතා කරන්නේ අඹ, අලිපේර වැනි බීජ ප්‍රරෝහණය කර ගැනීම සඳහාය.

ඉහත ප්‍රකාශවලින් වඩාත් සත්‍ය ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ,

1. A හා B පමණි
2. B හා C පමණි
3. A, B හා D පමණි
4. A, B හා C පමණි
5. A, C හා D පමණි

(31) කෘමියකු සහ මයිටාවකු අතර දක්නට ලැබෙන සමාන ලක්ෂණයක් වන්නේ,
1. බාහිර සැකිල්ලක් තිබීම
2. පාද යුගල් 3 ක් තිබීම
3. අධෝහනු සහිත මෞඛ උපාංග තිබීම
4. ස්පර්ශක යුගලක් තිබීම
5. බොහෝ විශේෂ පියාපත් සහිත වීම

(32) පහත දැක්වෙන වල්පැළෑටි අතරින් බහුවාර්ෂික වල්පැළෑටියක් වන්නේ,
1. *Vernonia cinerea*
2. *Acalipa indica*
3. *Commelina bengalensis*
4. *Emilia sonchifolia*
5. *Cyperus rotundus*

(33) මහවැලි ව්‍යාපාරයේ ඉදිකිරීම් කටයුතු සඳහා ගෙන්වන ලද යන්ත්‍රෝපකරණවල ඇමිණී, පස් සමඟ මෙරටට පැමිණි ආගන්තුක ආක්‍රමණශීලි වල් පැළෑටියක් ලෙස සලකන වල්පැළෑටිය වන්නේ,
1. පාතීනියම්
2. යෝද නිදිකුම්බා
3. ගඳපාන
4. කටකළු බෝවිටියා
5. වෙල් අනෝදා

(34) 

රූප සටහනේ දැක්වෙන ඇටවුම භාවිතා කරනු ලබන්නේ ශාකයක,
1. ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාවය මැනීමට ය.
2. උත්ස්වේදන සීඝ්‍රතාවය මැනීමට ය.
3. ආහාර පරිසංක්‍රමණය වන ආකාරය නිර්ණය කිරීමට ය.
4. ජල පරිවහන සිදුවන ආකාරය නිර්ණය කිරීමට ය.
5. ශ්වසන වේගය මැනීමට ය.

(35) කෘතිම සිංචනය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A ශුක්‍රාණු ලබා ගැනීමට පහසු ක්‍රමයක් ලෙස කෘතිම යෝනිය භාවිත වේ.
B ශුක්‍රාණු තනුක කිරීම සඳහා බිත්තර කහමදය සහ සෝඩියම් සිට්‍රේට් මාධ්‍ය භාවිතා කරයි.
C ශුක්‍රාණු තැන්පත් කරනු ලබන්නේ මදයට පැමිණි දෙනකගේ ග්‍රීවයේ කෙළවරය.
ඉහත ප්‍රකාශවලින් වඩාත් නිවැරදි වන්නේ,
1. A පමණි
2. B පමණි
3. C පමණි
4. A හා C පමණි
5. A, B හා C යන සියල්ලම ය.

(36) නිෂ්පාදන සාධක පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A ස්වභාවික සම්පතක් වීම
B සැපයුම බොහෝ විට ස්ථාවර වීම
C චංචල සාධකයක් වීම
D මිනිසා විසින් නිර්මිතව තිබීම
මෙම ප්‍රකාශවලින් භූමිය නැමති නිෂ්පාදන සාධකයට අයත් වන්නේ,
1. A හා B ය.
2. A හා C ය.
3. C හා D ය.
4. A, B හා C ය.
5. A, B හා D ය.

(37) අස්වනු නෙළීමේ පරිනත දර්ශකයක් (Harvesting maturity Index) නොවන්නේ,
1. කෙසෙල් ගෙඩිවල රවුම් ගතිය.
2. පුෂ්ප පිපීමේ සිට වයස සම්පූර්ණ වීම
3. අඹ ගෙඩිවල උරහිස් ඉස්සීම
4. අලිපේර ගෙඩිවල මතුපිට දිලිසෙන ස්වභාවය නැති වී යාම
5. මිදිගෙඩිවල කයිටිනීමය පිට සිවිය සෑදී නොතිබීම.

(38) කුකුළාගේ වටනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - යාන්ත්‍රික ජීර්ණයක් මෙන්ම රසායනික ජීර්ණයක් ද සිදුවිය හැකිය.

B - එන්සයිම ශ්‍රාවය වීමක් සිදු නොවේ.

C - යාන්ත්‍රික ජීර්ණයක් පමණක් සිදුවේ.

D - රසායනික ජීර්ණයක් පමණක් සිදුවේ.

ඉහත ප්‍රකාශවලින් වඩාත් නිවැරදි වන්නේ,

1. A පමණි
2. B පමණි
3. A හා B පමණි
4. A හා C පමණි
5. B හා D පමණි

(39) සයිලේජ යනු නිර්වායු තත්ව යටතේ පැසීමකට භාජනය කර සකස් කර ගත් සංරක්ෂිත තෙත් රළු ආහාරයකි. එහි අඩංගු විය යුතු ප්‍රධාන වාෂ්පශීලී අම්ලය වනුයේ.

1. බියුට්‍රික් අම්ලය
2. ඇසිටික් අම්ලය
3. ලැක්ටික් අම්ලය
4. ප්‍රොපියොනික් අම්ලය
5. නයිට්‍රික් අම්ලය

(40) ශාක බද්ධ කිරීම සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. අනුජය හා ග්‍රාහකය යන 2 ම එකට විශේෂයේ විය යුතුය.
2. ග්‍රාහකය තෝරා ගත යුත්තේ පරිනත ශාකවලින් පමණි.
3. ග්‍රාහකය තෝරා ගත යුත්තේ ඉහළ අස්වනු දෙන ප්‍රභේදයකිනි.
4. අනුජය තෝරා ගත යුත්තේ ගැඹුරු මූල පද්ධතියක් සහිත මවු ශාකයකිනි.
5. අනුජය තෝරා ගත යුත්තේ එල දැරූ ශාකයකිනි.

(41) ගොවිපලක සෞඛ්‍යමත් පසක් පවත්වා ගැනීම සඳහා අනුගමනය කළ යුත්තේ

A - ශාක හා සත්ව නිෂ්පාදනවල තිරසාර බව හා විවිධත්වය පවත්වා ගැනීම

B - ජල ගෝලය හා වායුගෝලය හා සම්බන්ධ ක්‍රියාකාරීත්වයන් ප්‍රශස්ථ ලෙස පවත්වා ගැනීම

C - නිෂ්පාදන පිරිවැය අඩුකර ලාභ වැඩිකර ගැනීම

D - වනාන්තර ලෙස ඇති භූමිවල වන ආවරණය අඩුකර වගාව සඳහා යොදා ගැනීම.

මින් සත්‍ය වන්නේ,

1. A, B හා C පමණි.
2. A, B හා D පමණි.
3. B, C හා D පමණි.
4. A, C හා D පමණි.
5. A, B, C හා D යන සියල්ලම ය.

(42) තැටි නගුලේ භූමිරෝදයේ කාර්යය වන්නේ,

1. පස් පිඩැල්ල කැපීමයි.
2. කැපුම් තලය කරකැවීමයි.
3. කැපුම් තලය නගුල් බඳට සවිකිරීම යි.
4. නගුල එක එල්ලේ රැගෙන යාම යි.
5. නගුලට දැනෙන කම්පන අවම කිරීම යි.

(43) බෝග වගාවකට ජල සම්පාදනය කිරීමේ දී ජල සම්පාදන අවශ්‍යතාව නිර්ණය කිරීමට දැනගත යුතු පාංශු සාධක වන්නේ,

1. පාංශු තෙතමන ප්‍රතිශතය, ක්ෂේත්‍රධාරිතාව හා දෘෂ්‍ය ඝනත්වය
2. පාංශු තෙතමන ප්‍රතිශතය, ක්ෂේත්‍රධාරිතාව හා පාංශු වයනය
3. පාංශු තෙතමන ප්‍රතිශතය, ක්ෂේත්‍රධාරිතාව හා සච්ඡිද්‍රතාවය
4. පසේ වයනය, ව්‍යුහය හා දෘෂ්‍ය ඝනත්වය
5. පසේ වයනය , ව්‍යුහය හා සච්ඡිද්‍රතාවය

(44) එක්තරා ගොවියකු තම එළවළු වගාවට ජලය සැපයීමට විසිරුම් ජල සම්පාදන පද්ධතියක් පිහිටවන ලදී. එහි දී ඔහු ජල පොම්පයක් භාවිතා කරන ලදී. ජල පොම්පය භාවිතා කිරීමේ අරමුණු වන්නේ,

1. ජලය පොළව මතුපිට ගැනීම ය.
2. ජලයේ විභව ශක්තිය වැඩි කිරීමට ය
3. ජලයේ චාලක ශක්තිය වැඩි කිරීම ය.
4. ජලයේ පරිමාව වැඩි කිරීම ය.
5. ජලයේ බර වැඩි කිරීම ය.

(45) දළ ආහාර පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. සෙලියුලෝස් සහිත දළ තන්තු ප්‍රමාණය 18% ට අඩු ප්‍රෝටීන් හා මේදය සාපේක්ෂව වැඩි ශාකමය ද්‍රව්‍ය වේ.
2. සෙලියුලෝස් සහිත දළ තන්තු ප්‍රමාණය 18% ට වැඩි ප්‍රෝටීන් හා මේදය සාපේක්ෂව අඩු ශාකමය සම්භවයක් ඇති ආහාර ද්‍රව්‍ය වේ.
3. සෙලියුලෝස් සහිත දළ තන්තු 18% ට වඩා වැඩි ප්‍රෝටීන් හා මේදය සාපේක්ෂව වැඩි ආහාර ද්‍රව්‍ය වේ.
4. සෙලියුලෝස් සහිත දළ තන්තු 18% ට වැඩි සරල ආමාශයික සතුන්ගේ පෝෂණයට වැදගත් වන ආහාර ද්‍රව්‍ය වේ.
5. සෙලියුලෝස් සහිත දළ තන්තු 18% ට අඩු සංකීර්ණ ආමාශයික සතුන්ගේ පෝෂණයට වැදගත්වන ආහාර ද්‍රව්‍ය වේ.

(46) ශරීරයට Ca අවශෝෂණය කර ගැනීම සඳහා උපකාරී වන විටමින් වර්ගය වනුයේ,

1. තයමින්
2. විටමින් C
3. රයිබොප්ලේවින්
4. විටමින් D
5. ෆෝලේට්

(47) එක්තරා ක්ෂේත්‍රයක මිරිස් වගාවක් සඳහා හෙක්ටයාරයට අවශ්‍ය N ප්‍රමාණය 350 Kg කි. පසෙන් ලබාගත හැකි N ප්‍රමාණය 200kg කි. හෙක්ටයාරයක මිරිස් වගාවට යොදන N ප්‍රභවය ලෙස යෙදිය යුතු යූරියා ප්‍රමානය වන්නේ,

1. $\frac{46}{100} \times 350kg$
2. $\frac{46}{100} \times 200kg$
3. $\frac{100}{46} \times 150kg$
4. $\frac{200}{350} \times 100kg$
5. $\frac{350}{46} \times 150kg$

(48) අස්වනු හානිය අවම කිරීමට පත්‍රමය එළවළු වර්ග කෙටි කාලයක් සඳහා ගබඩා කිරීමට වඩාත් සුදුසු වන්නේ,

1. වැඩි උෂ්ණත්වය හා වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවයයි
2. අඩු උෂ්ණත්වය හා වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවයයි
3. වැඩි උෂ්ණත්වය හා වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවයයි
4. වැඩි උෂ්ණත්වය හා අඩු සාපේක්ෂ ආර්ද්‍රතාවයයි
5. $-20^0C$ උෂ්ණත්වය තුළ ගබඩා කිරීමයි.

(49) ආහාර ද්‍රව්‍යවලට ගොවිබිමේ දී අහිතකර ද්‍රව්‍ය එකතු වීම අවම කිරීම සඳහා ඇති පද්ධති ප්‍රමිති හඳුන්වන්නේ,

1. HACCP
2. GMP
3. GAP
4. ISO
5. SLS

(50) අත්‍යවශ්‍ය නොවන ඇමයිනෝ අම්ලයක් වන්නේ,

1. වෙලින් ය.
2. හිස්ටිඩීන් ය.
3. ලයිසීන් ය.
4. ක්‍රියොනින් ය.
5. ටයිරොසින් ය.